| | |
|---|---|
| **මහ/මහාමායා බාලිකා විදුහල**<br>**MAHAMAYA GIRLS' COLLEGE** | |
| අවසාන වාර පරීක්ෂණය - 2022 (2021) | **ශ්‍රේණිය - 8** |
| **බුද්ධ ධර්මය** | **පැය 2** |

**විභාග අංකය / Index No** .................................

## 1 කොටස

- පහත සඳහන් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) දිව්‍යාංගනාවක් ලබා ගැනීමට නම් භාවනා කළ යුතු යැයි බුදුන් වහන්සේ උපදෙස් ලබා දුන්නේ,

1) ආනන්ද තෙරණුන්ට
2) නන්ද තෙරණුන්ට
3) දෙව්දත් තෙරණුන්ට
4) සැරියුත් තෙරණුන්ට

02) සුදත්ත සිටුවරයා බුදුරජාණන් වහන්සේ හමුවූයේ කොහේදීද?

1) කුසිනාරා නුවරදි
2) මේදතලුම්ව නම් නියම් ගමේදී
3) රජගහ නුවර සීත වනයේදී
4) චම්පා නුවරදී

03) "ඒ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මෙහි එන්නැයිහමුවීමට එන ආගන්තුකයන් උණුසුම්ව පිළිගනිති. කනට සුවදෙන වදන් තෙපලකි" මේ ආදී ලෙස බුදුන් වහන්සේ ගැන ප්‍රකාශ කරන ලද්දේ කවුද?

1) පොක්ඛරසාති බමුණා
2) සංජය පිරිවැජියා
3) සෝණ දණ්ඩ බමුණා
4) උපතිස්ස පිරිවැජියා

04) බුදුන් වහන්සේ පිරිනිවන් මංචකයේ වැඩහිදිමින් පවා ධර්මය දේශනා කළේ,

1) ඡත්ත මානවකයාට
2) සෝණ දණ්ඩ බමුණාට
3) අනේපිඩු සිටුතුමාට
4) සුභද්‍ර පිරිවැජියාට

05) සම්මා සම්බුදුරජාණන් වහන්සේ උතුම්වූ චතුරාර්ය සත්‍යය ගුරු උපදේශ නැතිව තමාගේ නුවණින්ම අවබෝධ කරගත් නිසා,

1) සම්මා සම්බුද්ධ නම් වන සේක
2) සුගත නම් වන සේක
3) ලෝක විදූ නම් වන සේක
4) අරහං නම් වන සේක

06) “අනිච්චාවත සංඛාරා” යනාදී ගාථා සජ්ඣායනා කරමින් පැන් වඩනු ලබන අවස්ථාවකි

1) හිසකෙස් කැපීමේදී
2) අත්පොත් තැබීමේදී
3) පුද්ගලයෙකු මිය ගිය විට
4) විවාහ උත්සවයකදී

07) බුදු ගුණ ගණන කීයද?

1) නවයකි
2) හයකි
3) විසිහතරකි
4) තුනකි

08) තෙරුවන් ගුන ඇතුළත් ගාථා සිහිකොට මරණින් මතු දෙව්ලොව උපත ලැබුවේ,

1) උපතිස්ස පිරිවැජියා
2) කෝලිය පිරිවැජියා
3) ඡත්ත මානවකයා
4) ාතාර්දොයය පුත්ත මානවකයා

09) වේදනා පරිග්ගහ සූත්‍රය අසා රහත් වූයේ,

1) මුගලන් හිමි
2) සැරියුත් හිමි
3) ආනන්ද හිමි
4) නන්ද හිමි

10) බුදුන් වෙත එළඹ සෘද්ධි ප්‍රාතිහාර්ය පෑ මුගලන් හිමි පිරිනිවන් පෑවේ,

1) රජගහනුවරදී
2) කාලසිලාවේදී
3) උපවත්තන සල් උයනේදී
4) දෙව්දහ නුවරදී

11) ලෝවැඩ සගරාව කෘතිය රචනා කළේ,

1) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
2) පැලෑනේ වජිරඥාන හිමි
3) වෛදේහ හිමි
4) වීදාගම මෛත්‍රීය හිමි

12) බුදුරජාණන් වහන්සේ මහා සීහනාද සූත්‍රය දේශනා කරන ලද්දේ,

1) විශාලා නුවර අසල වන පියසකදී
2) ජේතවනාරාම විහාරයේදී
3) බරණරස ඉසිපතන මිගදායේදී
4) දෙව්රම් වෙහෙරේදී

13) මජ්ඣම නිකාය කටපාඩමින් ආරක්ෂා කිරීමේ වගකීම පැවරුනේ,

1) ආනන්ද හිමි ඇතුළු ශිෂ්‍ය පිරිසට
2) සැරියුත් හිමි ඇතුළු ශිෂ්‍ය පිරිසට
3) මුගලන් හිමි ඇතුළු ශිෂ්‍ය පිරිසට
4) අනුරුද්ධ හිමි ඇතුළු ශිෂ්‍ය පිරිසට

14) පළමු ධර්ම සංගායනාව සඳහා සහභාගීවූ පිරිස,

1) පන්සියයකි
2) හත්සියයකි
3) නවසියයකි
4) දහසකි

15) මහා මංගල සූත්‍රයේ සඳහන් වන මංගල කරුණු ගණන,

1) තිස්අටකි
2) තිහකි
3) විසිහතරකි
4) පනහකි

16) හේමමාලා කුමරිය හා දන්ත කුමරු දළදා වහන්සේ ලක්දිවට වැඩම කරවන විට මෙරට රජකළ රජතුමා වූයේ,

1) IV වන පරාක්‍රමබාහු රජු
2) දේවානම්පියතිස්ස රජු
3) කිත්සිරි මෙවන් රජු
4) I වන විමලධර්මසූරිය රජු

17) දෙමාපියන්ගේ අවසරයකින් තොරව දරුවන් පැවදි නොකරන ලෙස බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියේ කව්ද?

1) බිම්බිසාර රජු
2) සුද්ධෝධන රජු
3) කොසොල් රජු
4) අජාසත් රජු

18) සත්වයාගේ ආයුෂ ගෙවී යාම නිසා මළුණයට පත්වීම,

1) කම්මක්ඛයයි
2) ආයුක්ඛයයි
3) උභයක්ඛයයි
4) උපච්ඡේදකයි

19) බුදුරජාණන් වහන්සේ අනණ සූත්‍රය දේශනා කරන ලද්දේ,

1) සෝණ දණ්ඩ බමුණාට
2) සම්මුජ්ජනී තෙරණුවන්ට
3) අනේපිඬු සිටුතුමන්ට
4) ඡත්තමානවකයාට

20) මහෞෂධ පඩිතුමාගේ නුවණ පරීක්ෂා කළ රජතුමා කවුද?

1) බිම්බිසාර රජු
2) වේදේහ රජු
3) වජ්ජි රජ දරුවන්
4) ධර්මාශෝක රජු

( ල 2 × 20 = 40)

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 5කට පිලිතුරු සපයන්න

01.

i. බුදුරජාණන් වහන්සේගේ අගසව් දෙනම නම් කරන්න.
ii. වචනයෙන් සිදුවන අකුසලකර්ම 2ක් ලියන්න
iii. බුදුරජාණන් වහන්සේ ගැටලු විසඳූ අවස්ථා 2ක් නම් කරන්න
iv. "කරන කලට පව් මිහිරිය මීසේ
විදින කලට දුක් දැඩිවෙයි ගිනිසේ" මෙම කවියේ ඉතිරි පද 2 සම්පූර්ණ කරන්න
v. ශ්‍රී දළදා වහන්සේ පිලිබඳ ලියැවුණු ග්‍රන්ථයක් නම් කරන්න.
vi. ආනන්තරීය පාපකර්මවලින් 2ක් ලියන්න
vii. සතරබ්‍රහ්ම විහරණ නම් කරන්න
viii. දළදා වහන්සේ වෙනුවෙන් පැවැත්වෙන වාර්ෂික පුද පූජා දෙකක් නම් කරන්න
ix. තමා උපමා කොට අන් අයට හිංසා නොකිරීම බුදුදහමෙහි හැඳින්වෙන්නේ කෙසේද?
x. දස සීලයේ එන අවසාන ශික්ෂා පදය නම් කරන්න

( ල 2× 10 = 20)

02.

i. බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය දේශනා කළේ කාටද? (ල 2)
ii. සිඟාලෝවාද සූත්‍රයේ අඹ-සැමි සබඳතා හා හිතමිතුරු සබඳතා ඇතුලත් වන දිශාවන් නම් කරන්න (ල 3)
iii. කලන මිතුරෙකු සතු ගුණාංග 3ක් ලියන්න (ල 5)

03.

i. තණ්හාවේ ප්‍රභේද 2ක් නම් කරන්න (ල 2)
ii. ඒවායින් එකක් කෙටියෙන් හඳුන්වන්න (ල 3)
iii. තණ්හාව දුකට හේතුවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න (ල 5)

04

i. බුදුරජාණන් වහන්සේ තුරුලතා ඇසුරෙහි වැඩසිටි අවස්ථා 2ක් නම් කරන්න (ල 2)
ii. ගසකින් අපට ලැබෙන සේවය බුදුදහමට අනුව පැහැදිලි කරන්න (ල 3)
iii. පාසල් ශිෂ්‍යයකු ලෙස තුරුලතා සංරක්ෂණයට ඔබට දායක විය හැක්කේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න (ල 5)

05.

i. බුදුරජාණන් වහන්සේ අනුමත කළ දැහැමි රැකියා 2ක් නම් කරන්න (ල 2)
ii. බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ දැහැමි නොවන රැකියා 3ක් නම් කරන්න (ල 3)
iii. ඉන් එක් දැහැමි නොවන රැකියාවක් නිසා සමාජයට සිදුවන අයහපත විස්තර කරන්න (ල 5)

06.

i. මංගල සූත්‍රෙය් සඳහන් මංගල කරුණුවලින් ළමුන්ට වැදගත් වන මංගල කරුණු 2ක් ලියන්න (ල 2)
ii. දෙමාපියන්ට උපස්ථාන කළ හැකි අවස්ථා 3ක් ලියන්න (ල 3)
iii. එදා දඹදිව වැසියන් මංගල කරුණු ලෙස හැඳින්වූයේ මොනවාදැයි නම් කරන්න (ල 5)

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න (ල 10)

i. බුදුගුණ භාවනාවේ ආනිශංස
ii. සිංහල බෞද්ධ සිරිත්
iii. දළදා පෙරහැර
iv. ප්‍රථම ධර්ම සංගායනාව